## 30

දින කීපයක් යන විට බියන්කා ලෙසින් වෙස් වලාගත් බිමල් ගිල්බා හා හොඳින්ම මිතුරුව සිටියේය.

ලෝනා (සුලෝචනා) පියානෝව වාදනය ඉගෙන ගන්නා අතරේ, ගිල්බා, බියන්කා (බිමල්)ට බලන්නට, වෙනත් කාමරයක රූපවාහිනිය පණ ගන්වා දුන්නාය. ඇතැම් විට ගිල්බා, බියන්කාට පෙන්නුවේ විශේෂ වීඩියෝ පට හා සී.වී.සී තැටිය. ඒ අතර - කාලිංගගේ ඇතැම් උත්සවයක ගත් විශේෂ රූප රාමු බිමල්ට දැක ගත හැකි විය. එහෙත් ඒ එකකවත් කාන්තා පෙනී සිටියේ නම් නැත.

කාලිංගගේ මන්දිරය හා ඒ පරිසරය ගැන බිමල් විශාල දැන උගත්තේ මේ දූරගාමී මාධ්‍යයෙනි. ගිල්බා දහවල නොදන්නම බිමල්ගේ සැලැස්මට උදව් දෙමින් ~~[illegible]~~ සිටියාය.

පියානෝ පන්තියෙන් පසු, "නිරංජලා සැලෝන්" එකට ආ පසු බියන්කා ඇඳුම් උනා, බොරු කොණ්ඩා ගලවා, යළිත් බිමල් බවට පත්වුනේය. ලෝනා සුලෝචනා වූවාය.

සුලෝචනාත්, නිරංජලාත් එක් කාමරයක් හවුල් කර ගත් අතරේ බිමල්ට වෙනම කාමරයක් ලැබුණි. එහි සාදා දුන් රස, ප්‍රණීත කෑම බීම වලද අඩුවක් නොවීය.

බිමල් නැමදුමෙන් අම්මාට කතා කරමින් ඇගේ දුක සැප විමසා බැලුවේය.

තමා කළුතර ගෙයක් පරීක්ෂක කාර්යාලයක කටයුතු කරන බවය බිමල් කියා සිටියේ. සුලෝචනා නිවාඩුවකට නිරංජලාගේ ගෙදර නැවතී සිටින බව පද්මා සුගාට කීවාය.

" පුර පෝය පහුවෙන කොට කාන්තාව ගෙදර එන්න පුළුවන් අම්මේ " බිමල් සුගාගේ සිත සැනසෙන්නට කීවේය. " මට හොඳ ඩිටෙක්ටිව් කෙනෙක් ඉන්නවා. සෙරෙ

හොයා බලන්න. අම්මා සනීපෙන් ඉන්නවද ?"

"ඔව් පුතා. හැමදාම තියෙන ලෙඩ තමයි ඉතින්. පද්මා අක්කා ඉන්නවනෙ දෙවියො වගේ මාව බල ගන්න. අනේ පුතාටත් ඉ සියලු දෙවියන්ගෙම ආරක්ෂාවයි"

"මං ඉදගෙන ඇවිත් යන්නං අම්මෙ" කී නිමල් ඒ පොරොන්දුවද ඉටු කළේය.

සති අන්තයක ඔහුට ගෙදර යා හැකි විය. දිනක් අරවින්ද ඔහුට කතා කළේය.

"සර්. පණිවිඩයක් කියන්න --" ක්ලෝද රියදුරා ඉතා කලබලව කීය.

"ඔව් - අරවින්ද ?"

"විජය දූෂ කිව්වා ආයෙත් ගාල්ල තියෙන්නෙ පුරපෝය ද කියලා"

තමා දැනටමත් ඒ බව දැනගත්තත් නිමල් එය අරවින්දට හැඟෙව්වේය.

"බොහෝම ඉස්තූතියි අරවින්ද ...!... බෝට්ටුව පිටත් වෙන වෙලාවක් කිව්වද ?"

"සාමාන්‍යයෙන් පාන්දර තමයි බෝට්ටුව පිටත් වෙන්නෙ. හොඳට හඳ පායන රාත්‍රියක්නෙ ?"

"ඒක හරි. එහෙම නං අරවින්ද - අවශ්‍ය උනොත් මං කතා කරනවා"

"හරි - සර්"

ඇතැම් සන්ධ්‍යාවක නිමල්, නිරෝෂා හා සුලෝචනා සමග කාඩ් සෙල්ලමක යෙදුණේය. තවත් රැයක එකිනාවත් හවුල් කරගෙන හතර දෙනා කැරම් සෙල්ලම් කළෝය.

ඇතැම් විටෙක, නිමල්, නිරෝෂා සමග කතා කළේ කාලපුණේ මන්දිරයෙන් පැලවී එන කවුරු මාලියන් ගැනය.

"කොයිකටත් මං පෑවටු දවල් එනකොට ආවෙ නැත්තං අක්කා පියසීලිකට කියනවනෙ අපි ගිය ගමන ගැන ?"

"බය වෙන්න එපා මල්ලි. මං තනිකං ලේඛියෙන් අරින්නෙ නෑ. කොහොමටත් බෝට්ටුව ආපහු එන්න එපාය ?"

"ඒක හරි."

"කාන්තා එකක හිටියෙ නැත්නම් ?" නිරංජලා ඇසුවාය.

"මං ඊට ඔය පරිසරය සේරම හොඳින් කරල බලාගෙන වෙස් වලාම ආරූ වනවා. මං කාලිංගට අඳුන ගන්නට පස්සෙ මං මිනිහට ලේඛියෙන් අරින්නෙ නෑ"

"ග්‍රීව ප්‍රහාරයෙන් අරන් එනවද ?"

"ග්‍රීව ප්‍රහාරයෙන් බැරිනං කොකාකෝලා හරි අල්ල ගන්නවා"

බිමල්ගේ ඒ කතාවට නිරංජලා හඬ නගා සිනාසුණාය.

"දැනටමම මං ඔය පරිසරය දැන ටික ටික දන්නවා. ගිල්බා මට ඔය පාටියක පින්තූර වීඩියෝ ටිකෙ පෙන්නුවා. සාමාන්‍යයෙන් ගෙදර සාලෙට හැඩ මම දන්නවා. කාලපුර තියෙන්නෙ කොහේද මම දන්නවා"

"හොඳයි හොඳයි.

"මෙන්න සර්ප්‍රයිස් එකක් තියෙන තැනක් හොයාගන්නෙ මට හොඳක් ජෝල් කරන්නැති." බිමල් කීය. "මගෙ හැන්ඩ් බෑග් එකේ මං හොඳ හොඳ ජෝල් ටිකක් අරන් යනවා" ඒ මොනවා දැයි බිමල් හෙළි කළේ නැත.

"මල්ලි ගිල්බා උඩට ගිය විදියනං හරි අපූරුයි. සුරූපමයි" නිරංජලා කීවාය.

"ගිල්බා දැන් මගෙ ගජ යාලුවා"

ඔය ඇත්තෙන්ම එසේම විය. බිමල් බියන්කා වෙතින් ඇසුරෙන ආකාරය ගිල්බාගේ සිත් ගති. බියන්කා සේ බිමල් ඇතැම් විට දැගර නැමුමක් නැද්දී ගිල්බා අත් තෙලෙවාන් දෙමින් සිනාසුණාය.

ගිල්බා පමණක් නොවේ, දින කීපයක් යනවිට, ලෙක්ස් සේම, මේසා ද බියන්කාගේ මිතුරියන් බවට පත්වූහ. ඇතැම් සවසක, ලෝනාගේ පන්තිය අවසන් වූ පසු උයනෙලේ තිබාතැනෙහි, මේසා හෝ ලෙක්ස් සමඟ ඒ නැත්නම් දෙදෙනාම සමඟ මද වේලාවක් විහිලු තහලු වෙන් ගත කරන්නට බියන්කාටත්, ලෝනාටත් අවස්ථාව ලැබිණි.

එවන් සන්ධ්‍යාවක, ඇතැම් විට මේසා රසෝ කැවිල්ලක් සාදා පිළිගැන්වූවාය. ඒ නැත්නම් බිස්කෝතු හා කෝපි. පානය ම, ලයෙන් පියානෝ වාදනය හඬක් නොවී නම්

මේසා සංගීත තැටියක් වාදනය කළාය.

කෙමෙන් කෙමෙන් මේසාගෙන් ලෙක්සිගෙන් යථා ස්වරූපයන් බිමල්ට මතු වෙන්නට විය. ඔවුන්ගේ ඇතැම් රහස් ලියන්නාගේ වේශයෙන් බිමල් දැන ගත්තේය. ඔවුන් එක මිනිසෙකු හා සැසඳෙන තාලයේ ඇත්තන් නොවූහ. එහෙත් ඔවුන්ගේ ඒ වලට නොවැටෙන්නට බිමල් වගබලා ගත්තේය.

කාලිංග පිළිබඳ යම් යම් තොරතුරු වටින් ගොඩින් හෙළිවිය.

"කාලිංග රස්පුටින් වගේ මිනිහෙක්" වරෙක ලෙක්සි කීවාය. "හරිම කාමාසක්තයි. ඇස් වසී කරනවා."

"මිනිහගෙ බැල්මට ඇස් මෝහනය වෙන්නෙ" මේසා කීවාය. "ඒ ඇස් දෙකේ මොකද්දෝ ආකර්ෂණීය ගැඹුරක් තියෙනවා"

"ඇත්තට?" බිමල් කීය.

"එතැනට ගියාම පස්සෙ මිනිහා හැමෝවම අල්ලෙ නටවනවා - නිකං පෝලිමට - පෝලිම් කාරයා" ලෙක්සි කියද්දී,

"කිසිම ගැහැනියෙක් මිනිහගෙන් බේරිලා යන්නෙ නෑ" යි මේසා කීවාය.

"ඒ පාටි වලට එන්නෙ සේරම ලොකු ලොකු අයනෙ" ලෙක්සි හෙළිකළාය. "හැබැයි [illegible] එළියට කවුරුවත් කාගෙවත් නම් ගම් අහන්නෙ නෑ. හැමෝම කාලිංගගෙ යාලුවො බව හැමෝම දන්නවා. සමහරු එක රැයක් මුණ ගැහුනාට පස්සෙ ඒ අයව ආයෙ ජීවිතේට දකින්න ලැබෙන්නෙ නෑ"

ඒ කතාවට බිමල්ගේ ඇඟ පුරා හිරියක් දුව ගියේය.

"ඒ කිව්වෙ - ?" බිමල් විමසුවේය.

"නෑ ඉතිං ආයෙත් සමහර අයට එයා ඉන්වයිට් කරන්නෙ නෑ. කාලිංගගෙ හිත දිනා ගත්තොත් ආයෙත් එන්න කියාවි. නැත්තං ඉතිං එක සැරයක් තමයි" මේසා කීවාය.

"ඒ උනාට එයාට තරහකාරයො නෑ" ලෙක්සි කීවාය. "හැම දේම විහිලුවෙන්..."

"ඔව් සමහර වෙලාවට ගේම්ස් කරනවා" මේසා එකතු කළාය.

"මොන ගේම්ස් ද?" සුලෝචනා කුතුහලයෙන් ඇසුවාය.

"ගිහිල්ලම බලන්න ඕනා- ලෝනා- ගිහිල්ලම බලන්න ඕනා" කී මේසා සුලෝචනාගේ නිකටින් අල්ලා සොලෙව්වාය.

"මේ කෙල්ලත් අපි එක්ක යනවද?" ලෙක්සි ඇසුවාය.

"ඇයි නැත්තෙ? මං පොඩි බබෙක් නෙමෙයි" සුලෝචනා කී කථාවට අන් තිදෙනාම සිනාසුණාහ.